# සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය ශක්තිමත් කරමු. මර්ධනයට එරෙහි වෙමු.

(සිවිල් සංවිධානයන්ට එරෙහිව මර්ධනය නීතිගත කිරීමේ රජයේ උත්සාහයන් හා ඒවාට එරෙහිව ජාතික හා ප්‍රාදේශීය සිවිල් සංවිධාන 677ක් සමග සිදු කළ සාකච්ඡාවන් පිළිබඳ පසුවිපරමක්)

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2022 දෙසැම්බර්

# පටුන


1. පෙරවදන 5
2. රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීමේ උත්සාහයන් පිළිබඳ ඉතිහාසය 7
3. සිවිල් සමාජ සංවිධාන නියාමනය කිරීම සඳහා වූ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන් 9

- 2005 අගෝස්තු 30 - නන්දන ගුණතිලක පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව 9
- නන්දන - විජිත අතුරු වාර්තාව 9
- සමාජ සේවා සංවිධාන පනත සංශෝධනය 2018 පෙබරවාරි 20 - අමාත්‍ය මනෝ ගනේෂන් මහතා විසින් 1980 අංක 31 දරන පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම 10
- 2020 පෙබරවාරි 19 - ජාතික ආරක්ෂාව පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාව (මලිත් ජයතිලක වාර්තාව) 11
- 2021 අගෝස්තු 09 - ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත වෙනුවට නව පනතක් ගෙන ඒමට කැබිනට් අනුමැතිය 12
- 2022 සැප්තැම්බර් 23 - මහජන ආරක්ෂාව පිළිබඳව අමාත්‍ය ටිරාන් අලස් මහතා සමග සිවිල් සමාජ නියෝජිතයින්ගේ සාකච්ඡා ආරම්භ වීම 12

4. ප්‍රාදේශීය සංවිධාන සමග ඔවුන් මුහුණ දෙන ගැටලු, විසඳුම් යෝජනාවන් හා නව මර්ධනීය නීති පිළිබඳ පැවැති සාකච්ඡාවන්හි අදහස් හා පොදු එකගතා 13

# පෙරවදන

## සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වය ශක්තිමත් කරමු!

ලෝක සිවිල් ව්‍යාපාරයට මෙන්ම, ලංකාවේ සිවිල් ව්‍යාපාරයට ඉතා විශාල ඉතිහාසයක් තිබේ. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතාට අනුව 1912-1915 කාලයේ පැවති අමද්‍යප ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ඇරඹි පැරණිතම සිවිල් ව්‍යාපාරය ලෙස සදහන් කර තිබේ. ඉන් පසුව වෘත්තීය සමිති ව්‍යාපාරයත්, 1971 කැරැල්ලෙන් පසුව ඇති වූ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය (CRM), සර්වෝදය ව්‍යාපාරය, ජාතීන් අතර යුක්තිය හා සාමය ඇති කිරීමේ ව්‍යාපාරය (MIRJE), ඉන් පසුව, ප්‍රජාතන්ත්‍රීය අයිතින් සුරකීමේ සංවිධානය (MDDR) ඉඩම් කෘෂි ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (MOLNAR) අතුරුදහන්වූවන්ගේ මාපිය දූ දරු සංවිධානය (AFMAD) නිදහසේ වේදිකාව (PFF) සාධාරණ සමාජයක් සදහා වූ ජාතික ව්‍යාපාරය (NMSJ) ඒසේ බිහි වූ සිවිල් ව්‍යාපාරයන් ලෙස සදහන් කළ හැක.

සිවිල් හා දේශපාලන අයිතීවාසිකම් වෙනුවෙන් හා සාමාජ ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් වෙනුවෙන් ද, ගොවි ධීවර ඇතුළු පාරිසරික අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක සංවිධාන මෙන්ම, ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන් මූලික කරගෙන පවතින විවිධ ජීවන අවශ්‍යතා මුල්කරගෙන ගොඩනැගී ඇති මරණාධාර, ග්‍රාම සංවර්ධන, කාන්තා, තරුණ, ණය සමිති හා මිතුරු හවුල් ආදීය සමග ගත් විට සැලකිය යුතු මට්ටමක සිවිල් සංවිධාන ප්‍රමාණයක් ලංකාව පුරාම ක්‍රියාත්මක වේ.

මේ සියල්ල රාජ්‍ය ව්‍යුහයට පිටින් ක්‍රියාත්මක වන සංවිධාන බැවින් මේවා රාජ්‍ය නොවන සංවිධාන ගනයට වැටේ. රජයේ කිසිදු අධිකාරියකට යටත් නොවන, ඒහි කිසිදු අධීක්ෂණයකට භාජනය නොවන, රජයේ කිසිදු ව්‍යුහයකින් පාලනය නොවන, තමුන් විසින් සකස්කරගත් අරමුණක් වෙනුවෙන් කටයුතු කරන මෙවැනි සක්‍රීය පුරවැසි ක්‍රියාකාරීත්වයක් සහිත රාජ්‍ය නොවන සංවිධාන තිස්දහසකට වැඩි ප්‍රමාණයක් මේ වන විට රජයේ ලියාපදිංචි වී ඇති බව ද වාර්තා වේ. ඒසේ කුමණ හෝ රාජ්‍ය ව්‍යුහයක මෙතෙක් ලියාපදිංචි වී නොමැති සංවිධාන ප්‍රමාණය ඊටත් වඩා බොහෝ වැඩි විය හැක.

මෙම සිවිල් සංවිධාන ලංකාවේ ක්‍රියාත්මක නොවන්න, ජනතාවගේ මූලික අයිතිවාසිකම් ඇතුළු මානව හිමිකම් පිළිබදවත්, අපරාධ හා සිවිල් නීති සම්බන්ධවත්, කාන්තා හා ළමා අයිතිවාසිකම් හා සුළුතර ප්‍රජාවන්ගේ අයිතීන් පිළිබදවත්, ගොවි, ධීවර හා පරිසරික අයිතීන්, නිදහස් හා සාධාරණ මැතිවරණයන් පිළිබදව අවබෝධයත්, ඒ සම්බන්ධව ක්‍රියාකාරීත්වය මීටත් වඩා බොහෝ අඩුවීමට වීමට ඉඩ තිබුනි.

මෙම සිවිල් සංවිධාන මිනිසුන් අතර ජනප්‍රිය වුයේ අතීතයේ සිට ඒහි ක්‍රියාකාරීන් විවිධ අභියෝගයන් මැද්දේ විශාල කැප කිරීමකින් හා උද්යෝගයකින් ඒ සම්බන්ධව කටයුතු කළ නිසාය. ලෝකයේ අලුත් දැනුම හා සංකෘතීන් මිනිසුන් අතරට රැගෙන ගියේ මෙම සිවිල් ක්‍රියාකාරීත්වය විසිනි. සමහර අවස්ථාවලදී රටේ ඇති වූ දේශපාලනික තත්ත්වයන් නිසා මෙසේ ක්‍රියාත්මක වූ සමහර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදු විය.

1988-89 භීෂණ සමයෙන් අතුරුදහන්වූ දරුවන්ගේ තොරතුරු ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, ඇම්නෙස්ට්‍රි ජාත්‍යන්තරය වැනි සංවිධාන වෙත යොමු කිරීමට කටයුතු කළ අතුරුදහන්වූවන්ගේ මා පිය දූ දරු සංවිධානය නියෝජනය කළ සමහර ක්‍රියාකාරීන් ඒවකට පැවති රජයේ දැඩි මර්ධනයට හසුවිය. මාතර, චන්ද්‍රදාස රණසිංහ වැනි අය අතුරුදහන්වූයේ මාතර ප්‍රදේශයේ අතුරුදහන්වූ පවුල් කිහිපයක තොරතුරු ලබාගෙන ඒන අතර තුර ඒම තොරතුරු පත්‍රිකා ද සමගිනි. ඒසේ ජීවිත පරිත්‍යාගයෙන් ඔවුන් විසින් ඒකතු කරන ලද තොරතුරු වාර්තා ඒදා ජිනීවා මානව හිමිකම් කවුන්සිලය වෙත රැගෙන යනු ලැබුවේ මහින්ද රජපක්ෂ හා වාසුදේව නානයක්කාර වැනි අය විසිනි. ඒම තොරතුරු ජාත්‍යන්තර තලයේ විශාල වශයෙන් ව්‍යාප්ත වීම නිසා ඇති වූ පීඩනයෙන් මිදීමට ඒවක පැවති රජයට තම මර්ධනය ලිහිල් කිරීමට සිදු විය. ඒ නිසාම සැලකිය යුතු තරුණ තරුණියන් පිරිසක් මරණයෙන් නිදහස් වූ අතර, පසුව ඇති වූ ආණ්ඩු වල ඒ අයගෙන් සමහරෙක් මැති ඇමතිකම් පවා දැරුවාය.

මේ ආකාරයේ ඉතා වැදගත් හා ඉතා අවධානම් සහගත ක්‍රියා මාර්ගයන් පවා මෙම සිවිල් සංවිධාන නියෝජිතයින් විසින් සිදු කර තිබුනි. මුල් අවස්ථාවේ මැතිවරණ නිරීක්ෂණයන් හි යෙදුන සිවිල් කණ්ඩායම් වෙත ද දැඩි මර්ධනයන් දියත් විය. සමහර අවස්ථාවල දී සිදු වූ පහරදීම් නිසා ඔවුන් ශරීරික දුබලකම්වලට පවා මුහුණ දෙන්නට සිදු විය. මෙසේ සිදු කළ ක්‍රියාකාරකම් හා කැපකිරීම් නිසා සැලකිය යුතු ජන ප්‍රසාදයක් මෙම සංවිධාන විසින් දිනාගෙන තිබුනි.

නමුත්, මෙම තත්ත්වය පසු කාලීනව දැනුවත්ව හා සැලසුම් සගතව වෙනස් කිරීමට ඒවකට දේශප්‍රේමීන් යැයි කියාගත් ආණ්ඩු මෙන්ම, විපක්ෂය නියෝජනය කළ පිරිස් විසින් සිදු කරන ලදී. සාමය, සංහිඳියාව, මානව හිමිකම්, මාධ්‍ය නිදහස ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී නිදහස වෙනුවෙන් කටයුතු කළ සංවිධානයන් හි කටවල් වසා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අඩපන කර, සමාජයෙන් කොන්කර ඔවුන් ජන අප්‍රසාදයට පත්කර තැබීමට ඔවුන්ට අවශ්‍ය විය.

ඒම අරමුණෙන් ඒවැනි සංවිධාන ඉලක්ක කරමින් විශාල අවලාද හා ද්වේශසගත ප්‍රචාරයන් ඒවකට පැවති රජයන් ද, ඊට සහාය දැක්වූ විපක්ෂයේ පිරිස් විසින්ද කරගෙන යන ලදී. මීට නොමද සහායක් රජයේ හා සමහර පුද්ගලික නාලිකා මගින් ලබා දෙන ලදී. ඔවුන් විසින් ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ඉතා දූෂිත බවද, සමහරු අන්තවාදී කණ්ඩායම් සමග සම්බන්ධතා ඇති බවද ප්‍රචාරය කරන ලදී. නමුත් මේ විවේචනයන්ට දශකයකට වැඩි කාලයක් ගතව ඇතත් මේ සම්බන්ධව කිසිවෙකුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමක් හෝ අවම වශයෙන් මේ සම්බන්ධව කිසිදු පරීක්ෂණයක් හෝ ආරම්භ කර ඇති බවක් අපට මෙතෙක් වාර්තා නොවේ.

මීට අමතරව, රජ්‍ය නොවන සංවිධාන පනත යටතේ ලියාපදිංචි වී ඇති සංවිධාන අද බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටී. ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික අනුමැතිය ලබා ගැනීමට සිදු වීම, අලුතින් ලියාපදිංචි කිරීම ඉතා දුෂ්කර වීම, බැංකු ගිණුම් අධීක්ෂණය හා ගිණුම් කටයුතු සීමා කිරීම, තම ප්‍රදේශයෙන් පිට වැඩ කිරීමට විශේෂ අනුමැතිය ලබා ගැනීමට සිදු වීම වැනි කාරණා දැනට ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු ලෙස හැඳින්විය හැක. ඊට අමතරව ආරක්ෂක අංශ විසින් නිතර සිදු කරනු ලබන සෝදිසි කිරීම්, නිරන්තර විමසීම් හා ඔවුන්ගේ බියගැන්වෙන සුළු හැසිරීම් හේතුවෙන් බොහෝ ප්‍රාදේශීය සංවිධාන විවිධාකාරයේ පීඩාවන්ට ලක්ව සිටී.

මේ සියළු දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටින සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන වර්තමානයේ තවත් ගැටළුවකට මුහුණ දීමට සිදුව තිබේ. ඒ 1981 අංක 31 දරණ ස්වේච්ඡා සමාජසේවා සංවිධාන පනත සංශෝධනය කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය හිමි වී එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබීම හේතුවෙනි.

නව සංශෝධනය කිසිසේත්ම සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වයට හිතරක එකක් නොවීමට ඉඩ ඇති අතර, නව සංශෝධනය තුළින් සියළුම සංවිධාන එක නීතියක් යටතේ ලියාපදිංචි කිරීමටත්, ඒ හරහා රජයේ නිරන්තර අධීක්ෂණයට හා නිරන්තර සෝදිසි කිරීම් සඳහා භාජනය වීමටත් බොහෝ විට ඉඩ තිබේ. එමෙන්ම, මෙම නව නීතිය යටතේ සමහර සංවිධානයන් හි ක්‍රියාකාරීත්වයන් පාලනය කිරීමටත් උත්සාහ දරණු ඇත.

මෙම උත්සාහය වැලැක්වීම සඳහා සියළු සංවිධාන මේ පිළිබඳව දැනුවත්ව හා එක්සත්ව ඒක අරමුණක් ඔස්සේ ක්‍රියා කළ යුතුව තිබේ. නව නීති ගෙන එනු ලබන්නේ නම් ඒ සඳහා සිවිල් සංවිධාන නියෝජිතයින්ගේ ද අදහස් ලබා ගැනීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර ඇති අපගේ මූලික අයිතිවාසිකම් හා ජාත්‍යන්තර සම්මුතින් මගින් ආරක්ෂා කර ඇති අපගේ අනෙකුත් සිවිල් හා දේශපාලණ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පදනම් කරමින් එය සැකසිය යුතුය.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ - රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීමේ උත්සාහයන් පිළිබඳව ඉතිහාසය

රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීම සඳහා පැවති බොහෝ ආණ්ඩු විවිධ උත්සාහයන් ගෙන තිබේ. එය සාධාරණය කිරීම සඳහා අතීතයේ ඔවුන් භාවිතා කළ අවිය වුයේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් ආරක්ෂා කිරීමට ක්‍රියා කරන මුවාවෙන් විදේශ අරමුදල් භාවිතා කරමින් ආණ්ඩු පෙරලීමට කටයුතු කරන බවට වූ චෝදනාව සමහර සංවිධාන වෙත ඉදිරිපත් කිරීමයි.

ඉන් පසුව ශ්‍රී ලංකාවේ ඇති වූ සිවිල් යුධමය තත්ත්වයත්, පාස්කු ප්‍රහාරයත් සමග සිවිල් සංවිධාන වෙත තවත් චෝදනා පත්‍රයක් ඒකතු විය. ඒ අලුත් චෝදනා වුයේ, සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වීම, ඒකීය රාජ්‍යයේ ස්වෛරීභාවය හා ස්වාධීනත්වයට සහ භෞමික අඛණ්ඩත්වයට තර්ජනය වීම, වාර්ගික හා ආගමික සහජීවනයට බලපෑම් සිදු කිරීම හා ශ්‍රී ලංකාව සම්බන්ධව වැරදි හා අසත්‍ය තොරතුරු සැපයීම වැනි කාරනා ප්‍රධාන චෝදනාවන් ලෙස සැලකිය හැක.

මීට අමතරව, සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය තුළ විශාල දූෂණ, වංචා හා අක්‍රමිකා පවතින බවත්, මෙම සංවිධාන ක්‍රියාකාරීත්වයන් තුළ විනිවිදභාවයක් හා වගවීමක් නොමැති බවට ද චෝදනා කරයි.

කිසියම් සංවිධානයකට එරෙහිව එවැනි චෝදනාවක් පවතින්නේ නම් එය ඉතා බැරෑම් චෝදනා ලෙස අප ද සලකනු ලබන අතර, ඒ සඳහා පවතින නීති යටතේ කටයුතු කිරීමට හැකියාව තිබේ. ඒ සදනා නව නීති පැණවීමේ කිසිදු අවශ්‍යතාවයක් අපට නොපෙනේ.

වංචා, දූෂණ හෝ අක්‍රමිකතා සම්බන්ධව අපගේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ කටයුතු කළ හැකි අතර, ත්‍රස්තවාදී කටයුතු සඳහා උදව් කිරීම සම්බන්ධව 2005 අංක 25 දරණ ත්‍රස්තවාදී මුල්‍යකරණ මර්දනය කිරීමේ පනත පිළිබදව සම්මුතිය යටතේත්, 2006 අංක 6 දරණ මුල්‍ය ගනුදෙනු වාර්තාකරන පනත, 2006 අංක 5 දරණ මුදල් විශුද්ධකරණය වැළැක්වීමේ පනත වැනි පනත් යටතේ කටයුතු කළ හැක. මේ සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, මුල්‍ය අපරාධ විමර්ශන අංශය, ත්‍රස්තවාදී විමර්ශන අංශය හා මහ බැංකුවේ මුල්‍ය බුද්ධි ඒකකය වැනි විශේෂ රාජ්‍ය බුද්ධි නියෝජිත ආයතන හරහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට හැකියාව තිබේ.

එමෙන්ම, වෙනත් සිවිල් හෝ පරිපාලන ගැටළුවක් වේ නම් හෝ යම් කිසි පුද්ගලයෙකුට සිදුවන පාඩුවක්, වන්දියක් හෝ සහන ලබා ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සිවිල් නීතිය තුළ අවශ්‍ය තරම් පිළියම් තිබේ. එබැවින් සිවිල් සංවිධාන සඳහා නැවත අලුතින් නීති සම්පාදනය කිරීම කිසිසේත් සාධාරණය කළ නොහැක.

එමෙන්ම, නව නීතියක් සැකසෙන්නේ නම්, ඒ සඳහා සිවිල් සමාජ නියෝජිතයින්ගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලණ අයිතිවාසිකම් පිළිබදව ප්‍රඥප්තියේ මුලධර්ම මත පදනම්ව එම කටයුත්ත සිදු විය යුතුය.

සිවිල් සංවිධාන වෙනුවෙන් සැකසෙන එවැනි නීතියක් පහත සඳහන් මූලධර්ම මත පදනම්ව සිදු කළ යුතුය.

1. අදහස් ප්‍රකාශ කිරීමේ, සමාගමේ හා රැස්වීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් වලට ගරු කරමින් අදාල නීති සම්පාදනය.

2. රාජ්‍ය නොවන සංවිධාන වෙත සමාන ලෙස සැලකීම හා වෙනස් කොට නොසැලකීම

3. අනවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම් හෝ අතපෙවීම් නතර කොට සංවිධානයේ ස්වාධීනත්වය හා සංවිධානයේ වටිනාකම් ගරුකරමින් නිදහසේ කටයුතු කිරීමට ඉඩ කඩ සලසා දීම

4. අවශ්‍යතා මත ජාලගතවීම, සන්නිවේදනය අනෙකුත් සංවිධාන හෝ කණ්ඩායම් සමග ඒකාබද්ධව කටයුතු කිරීමට ඇති අයිතියට ගරු කිරීම

5. නීතිඥාණුකූලව ලැබෙන අරමුදල් සංවිධානයේ අරමුණු හා සැලසුම් මත සිදු කිරීමට නිදහස ලබා දීම

6. සිවිල් සමාජ සංවිධාන ඉලක්කකර සකසනු ලබන නීති සඳහා එම සංවිධානයන් හි අදහස් ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසීමත් නීති සකසන්නේ නම් ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම

7. සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය සක්‍රීයව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිසරය රට තුළ නිර්මාණය කිරීම.

රාජ්‍ය නොවන සංවිධානයන් හි ක්‍රියාකාරීත්වයන් අඩපන කිරීම සඳහා පැවති ආණ්ඩු විසින් විවිධ උපක්‍රම භාවිතා කරනු ලැබූ අතර, ඉන් වැඩිපුරම භාවිතා වුයේ පහත සඳහන් ක්‍රියාකාරීත්වයන් කෙරෙහිය.

1. යම් කිසි නීති රාමුවක් තුළට සියලූ රාජ්‍ය නොවන සංවිධාන ගෙන ඒ හරහා පාලනය හෝ අධීක්ෂණ සිදු කිරීම සඳහා නීති සම්පාදනය

2. පොලීසිය හමුදා ඇතුළු ආරක්ෂක අංශයන්ගේ දැඩි අධීක්ෂනයට ලක් කිරීම.

3. පරිපාලනමය වශයෙන් විවිධාකර සීමාවන් හා දුෂ්කරතා ඇති කර ක්‍රියාකාරීත්වයන් අඩපන කිරීම

4. රාජ්‍ය නොවන සංවිධාන අලූතින් ලියපදිංචිය සීමා කිරීම සඳහා දැඩි කොන්දේසි පැනවීම

5. රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වයට එරෙහිව පුළුල් ප්‍රචාරක වැඩ පිළිවෙලක් දියත් කිරීම

වර්තමානය වන විට රාජ්‍ය නොවන සංවිධාන ආකාර කිහිපයකට ලියපදිංචිය සිදු කල හැක.

1. ස්වේච්ඡා සමාජ සේවා ආයතන පනත (1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත් කෙටුම්පත

2. සමාගම් පණත

3. භාරයක් ලෙස භාර ඔප්පුවක් මගින්

4. සමිති අඥා පනත

5. වෘත්තීය සමිති අඥා පනත

6. සමූපකාර සමිති අඥා පනත

7. පාර්ලිමේන්තු පනත් මගින් ලියාපදිංචි කරන පුන්‍ය භාර හෝ පදනම් ලෙස

ඉහත කිසිදු නීතියක් යටතේ ලියාපදිංචි නොවී සංවිධානයකට කටයුතු කිරීම අපගේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 14(1)(ආ) සහ (ඇ) ව්‍යවස්ථාවේ සඳහන් රැස්වීමේ හා සමාගමේ නිදහස මගින් තහවුරුකර තිබේ. ඒ අනුව සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, නිදහසේ වේදිකාව, සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය වැනි සංවිධාන ඒසේ ලියාපදිංචි නොවී සැලකිය යුතු වැඩකොටසක් සිදු කළ සංවිධාන ලෙස සඳහන් කළ හැක.

# සිවිල් සමාජ සංවිධාන නියාමනය කිරීම සඳහා වූ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වය

## 2005 අගෝස්තු 30 - නන්දන ගුණතිලක පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව

රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය හා බලපෑම පිළිබඳ කරුණු විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් 2005 අගෝස්තු මස පත් කරනු ලැබීය. එවකට ජනතා විමුක්ති පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නන්දන ගුණතිලක මහතා විසින් 2005 අගෝස්තු මස 30 වැනි දින ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව මෙම විශේෂ කාරක සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 23 දෙනෙකු අයත් විය. පසුව නන්දන ගුණතිලක පෞද්ලික හේතුවක් මත කාරක සභාවේ සභාපතීත්වයෙන් ඉවත් වූ අතර ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මෙම කාරක සභාවේ සභාපතිත්වයට පත් විය.

මෙම කාරක සභාව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විදේශාධාර ලබන රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව සොයා බැලීම, එම රාජ්‍ය නොවන සංවිධානයන්හි මූල්‍ය කටයුතුවල පවත්නා විනිවිදභාවය කවරාකාරදැයි සොයා බැලීම, එකී රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා ජාතික ආරක්ෂාව කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනාගැනීම, එම රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය ජාතික සහ සමාජ යහපැවැත්ම කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනාගැනීමට ද මෙම රාජ්‍ය නොවන සංවිධාන අරභයා ශ්‍රී ලංකා රජය කටයුතු කළ අන්දම පිළිබඳ කරුණු සොයා බලා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස වූ විශේෂ කාරක සභාවක් ලෙස කටයුතු කරණු ලැබීය.

## නන්දන - විජිත අතුරු වාර්තාව

රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය හා බලපෑම පිළිබඳ කරුණු විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් 2005 අගෝස්තු මස පත් කරනු ලැබීය. '2005 අගෝස්තු මස 30 වැනි දින ගරු නන්දන ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විදේශාධාර ලබන රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව සොයා බැලීම පිණිස ද, එම රාජ්‍ය නොවන සංවිධානයන්හි මූල්‍ය කටයුතුවල පවත්නා විනිවිදභාවය කවරාකාරදැයි සොයා බැලීම පිණිස ද, එකී රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා ජාතික ආරක්ෂාව කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනාග ැනීම පිණිසද, එම රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය ජාතික සහ සමාජ යහපැවැත්ම කෙරෙහි බලපා ඇත්තේ කවර අයුරින්දැයි හඳුනාගැනීමටද මෙම රාජ්‍ය නොවන සංවිධාන අරභයා ශ්‍රී ලංකා රජය කටයුතු කළ අන්දම පිළිබඳ කරුණු සොයා බලා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීම පිණිස ද, පාර්ලිමේන්තුවට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිසද විශේෂ කාරක සභාවක් පත් කිරීමට පාර්ලිමේන්තුව විසින් තීරණය කරන ලදී.' පසුව නන්දන ගුණතිලක පෞද්ලික හේතුවක් මත කාරක සභාවේ සභාපතීත්වයෙන් ඉවත් වන අතර ඒ සඳහා විජිත හේරත් පත් කරයි. කමිටුවේ සමස්ත සාමාජික සංඛ්‍යාව 23කි.

එම අතුරු වාර්තාවේ යෝජනා අතර,

01. රාජ්‍ය නොවන සංවිධානවල විනිවිදභාවය හා වගවීම වර්ධනය වන ආකාරයට විධිමත් කිරීම හා ක්‍රමවත් නීති පද්ධතියක් හඳුන්වා දීම යෝජනා කරන අතර 1980 අංක 31 දරන සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත අවලංගු කොට නව පනත් කෙටුම්පතක් සකස් කර නීතිගත කළ යුතු බව අවධාරණය කරයි.

02. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධීක්ෂණය සඳහා වූ නීති ප්‍රතිපාදන සකස් කිරීම සඳහා සියලු බලතල සහිත කොමිෂන් සභාවක් පත් කිරීමටද රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලංකාවේ විධිමත් නිර්වචනයක් නොමැති හෙයින් සහ පවත්නා පනතේ නිර්වචනය ප්‍රමාණවත් නොවන හෙයින් රාජ්‍ය නොවන සංවිධාන වෙනත් කිසියම් නීතියක් යටතේ ලියාපදිංචි වී තිබුනද අනිවාර්යෙන්ම මෙම කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමට යෝජනා කරයි.

03. වාර්තාවේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ නිර්වචනයයක්ද සපයනු ලබයිදේශීය හා විදේශිය ආධාර සහිතව සමාජ ආරක්ෂණය, සුබහසාධනය හා සංවර්ධනය අරමුණු කර දේශීය නීති හා ප්‍රතිපත්ති රාමුවට ද සාරධර්මවලටද අනුකූල වූ ව්‍යවස්ථාවක් හා කලමනාකාරණ පද්ධතියක් සහිතව ලාභ අපේක්ෂාවෙන් තොර ස්වේච්ඡාවෙන් සේවය කිරීම සඳහා රාජ්‍ය ගිවිසුමක් නොමැතිව පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් ගොඩනඟාගත් සියලුම සංවිධාන ස්වේච්ඡා සමාජ සංවිධාන හෙවත් රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් නිර්වචනය කෙරේ යන්න විය යුතුය.

04. හඳුන්වා දෙනු ලබන කොමිෂන් සභාවේ කාර්ය හා බලතල, රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ ප්‍රතිපත්ති, ඒවා කලමනාකාරණය සහ අධීක්ෂණයට අවශ්‍ය ප්‍රතිපත්ති විගණනයට සහ විමර්ශනයට අදාළ නීතිමය විධිවිධාන ඇතුළත් කළ යුතු වීම.

05. මෙම කොමිෂන් සභාවේ බලතල දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවලට විමධ්‍යගත කර ක්‍රියාත්මක කිරීමට සැලස්වීම. එහිදී රාජ්‍ය නොවන සංවිධානවල දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරකම් රාජ්‍ය යාන්ත්‍රණය සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් සකස් විය යුතුය.

06. රාජ්‍ය නොවන සංවිධාන සඳහා අනිවාර්ය ලියාපදිංචියක් මෙම කමිටුව නිර්දේශ කර ඇත. 'ලියාපදිංචි නොවූ රාජ්‍ය නොවන සංවිධාන සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැවින් රාජ්‍ය නොවන සංවිධාන මෙරට තුළ ලියාපදිංචි කිරීම අනිවාර්ය කළ යුතු බවද රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේදී එය රටේ පවතින මූලික නීතියට යටත්ව හා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසිවලට යටත්ව සිදුකළ යුතුය.'

## සමාජ සේවා සංවිධාන පනත සංශෝධනය - 2018 පෙබරවාරි 20 - අමාත්‍ය මනෝ ගනේෂන් මහතා විසින් 1980 අංක 31 දරන පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම

1980 අංක 31 (එල්.ඩී.ඕ. 32/2011) දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත් කෙටුම්පත සම්මත කර 2018 පෙබරවාරි 20 වැනි දින ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. යහපාලන ආණ්ඩු සමයේ මනෝ ගනේෂන් අමාත්‍යවරයාගේ අමාත්‍යංශය මගින් සකස් කෙරුන මෙම කෙටුම්පත සකස් වන්නේ සක්‍රිය සිවිල් සංවිධානවල අදහස් විමසීමකින් තොරව වීම ද විශේෂත්වයකි.

එම නිසා මෙය එක්රැස් වීමේ නිදහස, අදහස් ප්‍රකාශනයේ නිදහස, සිතීම, හෘදය සාක්ෂිය, විශ්වාසය සහ පෞද්ගලිකත්වයට ඇති අයිතිය සම්බන්ධ නිදහස යන අයිතීන් උල්ලංඝනය කරන පනතක් ලෙස විවේචනයට ලක් විය. මෙම කෙටුම්පත හරහා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ජනරාල්වරයාට, විෂය භාර අමාත්‍යවරයාට සහ අමාත්‍යාංශ ලේකම්වරයාට රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස අර්ථකථනය කර ඇති ඕනෑම කණ්ඩායමක් සම්බන්ධයෙන් පෙර නොවූ විරූ පාලන බලයක් ලබා දෙයි.

පුළුල් පරාසයක ක්‍රියාකාරී වන සමාජ බලපෑම් කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන යන අර්ථකථනය තුළට හසු කර ගැනීම සඳහා මෙම කෙටුම්පත තුළින් උත්සාහ දරන හැඩක් දක්නට ලැබේ. එම සියලු සංවිධාන, ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම සහ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වන අතර එසේ නොවන සංවිධානවලට අපරාධ වගකීම් පවරමින් සාපරාධී දණ්ඩනවලට යටත් කිරීමේ හැකියාව පවතී. විශේෂයෙන්ම කිසිදු අධිකරණමය අධීක්ෂණයකින් තොරව, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලයට රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීමට ඉඩකඩ ලැබී තිබේ. කිසියම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු වෙන බවට සාධාරණ සැකයක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි නිර්ණායක නොමැතිව පවා ''තොරතුරු ඉල්ලීම සහ ලබා ගැනීම'' සඳහා බලයක් මෙමගින් ලේකම් කාර්යාලයට පැවරේ.

එහෙත් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එල්ල වූ විරෝධතා හමුවේ සංවිධාන නියෝජිතයන් සමඟ සිදුකළ සාකච්ඡාවකින් අනතුරුව පනත හකුලා ගැනීමට ආණ්ඩුවට සිදුවිය.

අමාත්‍යවරයා විසින් මෙම පනත් කෙටුම්පත සංශෝධනය සදහා සිවිල් සමාජයේ අදහස් ලබා ගැනීමක් සිදු නොකළ අතර, ඒ සදහා කළ ඉල්ලීම් සදහා ද සුදුසු ප්‍රතිචාරයක් නොලැබුනි. පසුව 2018 මාර්තු 27 වන දින හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සමග සිවිල් සමාජ නියෝජිතයින් සිදු කළ සාකච්ඡාවකින් පසුව එළඹෙන ලද එකගතාවයක් මත කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ ඉහත සිවිල් සංවිධාන සංශෝධන කෙටුම්පත ඉල්ලා අස්කර ගනු ලැබිය.

එමෙන්ම, අග්‍රාමාත්‍යවරයා සමග පැමිණි එකගත්වයකින් පසුව සිවිල් සමාජ නියෝජිතයන් ගෙන් සමන්විත කමිටුවක් විසින් මෙම කෙටුම්පත සදහා අදාල සංශෝධනයන් ඉදිරිපත් කරන ලෙස කළ දැනුම්දීමට අනුව, සිවිල් සමාජ නියෝජිතයින් විසින් දිවයින පුරා පළත් නමයම නියෝජනය කරමින් සිවිල් සංවිධාන නියෝජිතයින් 233ක් සමග සිදු කළ අදහස් විමසීමකින් පසුව 2019 අගෝස්තු මාසයේ දී 1980 අංක 31 දරන පනත සදහා යෝජිත සංශෝධන විෂයභාර ඇමතිවරයාට හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය වෙත භාරදෙන ලදී.

නමුත්, 2019 නොවැම්බර් මාසයේ සිදු වූ ආණ්ඩු මාරුවෙන් පසුව මෙම ක්‍රියාවලිය නැවතත් සම්පූර්ණයෙන් ඇණ හිටි අතර, එතෙක් ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගතිය සහ හින්දු ආගමික කටයුතු පිළිබද අමාත්‍යංශය යටතේ පැවති රාජ්‍ය නොවන සංවිධාන පිළිබදව ජාතික ලේකම් කාර්යායල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය යටතට ගනු ලැබීය.

ඉන් පසුව රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය සදහා නව අධ්‍යක්ෂකවරයෙක් පත් වූ අතර, 2020 ජුනි මාසයේ දී පත් වූ නව අධ්‍යක්ෂකවරයා විසින් රාජ්‍ය නොවන සංවිධාන පනත සංශෝධනය සදහා යෝජනා ලබා දෙන ලෙස කළ ඉල්ලීම අනුව ද 2019 අගෝස්තු මාසයේ දී එම ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ යෝජනා නැවතත් 2020 අගෝස්තු මාසයේ ඔහු වෙත යොමු කරන ලදී.

## 2020 පෙබරවාරි 19 - ජාතික ආරක්ෂාව පිළිබදව ආංශික අධීක්ෂන කාරක සභා වාර්තාව (මලිත් ජයතිලක වාර්තාව)

ජාතීන් හා ආගම් අතර මිත්‍රත්වය වර්ධනය කරවමින් නව ත්‍රස්තවාදය හා අන්තවාදය මුලින් උපුටා දැමීමට අවශ්‍ය වන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාල නීතිරීති සම්පාදනය සහ ක්‍රියාත්මක කරවීමේ යෝජනාවලිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මලිත් ජයතිලක මහතාගේ සභාපතිවයෙන් යුත් * ජාතික ආරක්ෂාව පිළිබදව ආංශික අධීක්ෂන කාරක සභාව වාර්තාව තුළින් රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වය පාලනය කිරීම සදහා යෝජනා ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

යහපාලන සමයේ පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 යටතේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මලිත් ජයතිලකගේ සභාපතිත්වයෙන් යුතුව ඉහත කී ජාතික ආරක්ෂාව සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාව පත් කරනු ලැබිය. ''ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කරවමින් නව ත්‍රස්තවාදය සහ අන්තවාදය මුලිනුපුටා දැමීමට අවශ්‍ය වන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ නීති රීති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ යෝජනාවලිය සම්බන්ධයෙන් වාර්තාව,'' ලෙසින් නම් කෙරුණු, සුවිශේෂී කරුණු ගණනාවක් ඇතුළත් වාර්තාව පෙබරවාරි මස පාර්ලිමේන්තුවේ සභාගත කෙරුණි.

සිවිල් සමාජය සහ එහි ක්‍රියාකාරීත්වය, පාලනය සම්බන්ධයෙන් නිර්දේශ ගණනාවක් ද මෙම වාර්තාවට ඇතුළත්ව තිබුණි. උතුරු නැගෙනහිර යුද සමය තුළ දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ මහජනතාවට තිබුණා යැයි ඔවුන් විසින් පැහැදිලි කරන විරෝධාකල්පය, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් කෙරුණු විමර්ශනවලදී අනාවරණය කෙරුණා යැයි කමිටුව විසින් සඳහන් කරන රාජ්‍ය නොවන සංවිධානවල ලියාපදිංචිය පිළිබඳ ගැටලුව මෙන්ම මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සහ ජාතික බුද්ධි සේවා ප්‍රධානියා හරහා ලබාගත් තොරතුරු අනුව සිවිල් සමාජය, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තක්‍රියා සඳහා මුදල් සැපයීම යන මේවා අතර සම්බන්ධයක් ඇතැයි යන කාරණා මත පදනම්ව නිර්දේශ නිකුත් කිරීමට මෙම කමිටුව කටයුතු කර තිබේ.

සිවිල් සමාජ සංවිධාන දැනට වඩා බරපතළ ලෙස රාජ්‍ය අධීක්ෂණයට ලක්කළ යුතු යැයි කමිටුව විසින් අවධාරණය කරයි. එසේම පැවති රජය විසින් ගෙන එනු ලදුව පසුව අත්හැර දැමූ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය සහ අධීක්ෂණය) පනතෙහි සංශෝධන පනත් කෙටුම්පත ගැසට් කර එය සම්මත කරගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. මහ බැංකුවේ මුදල් බුද්ධි මණ්ඩලය, ජාතික බුද්ධි ප්‍රධානියාගේ කාර්යාලය සහ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ වැඩසටහනක් හරහා දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට ලැබෙන මුදල් ආධාර නියාමනය කිරීමට ද වාර්තාව මගින් නිර්දේශ කරනු ලැබ තිබේ. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය යටතේ විදේශ දායකත්ව නියාමන පනත වැනි පනතක් ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ආධාර නිසි ලෙස විගණනය කිරීමට පියවර ගැනීම ඇතුළු නිර්දේශ ගණනාවක් මෙමඟින් ඉදිරිපත් කර තිබේ.

ජාතික ආරක්ෂාව පිළිබඳව ආංශික අධීක්ෂන කාරක සභාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 13 දෙනෙකු සහභාගී වී සිටි අතර මෙම කාරක සභාව විසින් ජාතික ආරක්ෂාව සම්බන්ධව පිටු 120 කින් සමන්විත වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. එම වාර්තාවේ 9වන පරිච්ඡේදය මගින් රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය බලගැන්වීම හා නීති ගත කිරීම සම්බන්ධව විශේෂයෙන් කරුණු දක්වා තිබේ.

මෙම වාර්තාව මගින් නිර්දේශ 7ක් සිදු කර ඇති අතර, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව අදාල පනත් කෙටුම්පතට අදාල ගැසට් නිවේදනය නිකුත් කිරීම ඇති සියළු බාදක ඉවත් කිරීම, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නැති සංවිධාන නීති විරෝධී සංවිධාන ලෙස කිරීම හා එවැනි සංවිධාන වෙත ලබා දෙන දඩුවම් නිර්වචනය කිරීම, ලංකාවට ලැබෙන සියලූ විදෙස් අරමුදල් පුළුල් නියාමනයකට ලක්කිරීම, සියලුම රාජ්‍ය නොවන සංවිධාන එක් ආයතනයත් තුළ පමණක් ලියාපදිංචිය සිදු කිරීම ඇතුළු නිර්දේශ එහි ඇතුලත්ව තිබේ.

## 2021 අගෝස්තු 09 - ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත වෙනුවට නව පනතක් ගෙන ඒමට කැබිනට් අනුමැතිය

වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සංශෝධන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත ප්‍රමාණවත් නොවන නිසා ඒ වෙනුවට නව පනතක් ගෙන ඒමට ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් 2021 අගෝස්තු 9 වන දින ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට කැබිනට් අනුමැතිය හිමිවීම.

## 2022 සැප්තැම්බර් 23 - මහජන ආරක්ෂාව පිළිබඳව අමාත්‍ය ටිරාන් අලස් මහතා සමග සිවිල් සමාජ නියෝජිතයින්ගේ සාකච්ජා ආරම්භ වීම

2021 අගෝස්තු 09 වන දින කැබිනට් මණ්ඩලය අනුමැතිය අනුව සකස්කර ඇති 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත වෙනුවට ගෙන ඒමට නියමිත නව පනත පිළිබව විමසා ආයතන කිහිපයක් වෙත තොරතුරු පණත යටතේ පවා සිදු කළ ඉල්ලීම් වලට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුනි.

මේ අතර මහජන ආරක්ෂාව පිළිබඳව අමාත්‍ය ටිරාන් අලස් මහතා විසින් 2022 සැප්තැම්බර් 23 වන දින සිවිල් සමාජ නියෝජිත කණ්ඩායමක් වෙත ලබා දුන් සාකච්ඡාවකදී කළ ඉල්ලීමක් අනුව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත සම්බන්ධව ඔවුන්ගේ සංශෝධන 2022 ඔක්තෝබර් 07 වන දින ලබා දෙන ලදී.

මේ සම්බන්ධව අමාත්‍යවරයා සමග පැවති දෙවැනි සාකච්ඡාවේදී ඉදිරිපත් වී ඇති එම සංශෝධන කිසිසේත් පිළිගැනීමට නොහැකි බව සිවිල් සමාජ නියෝජිතයින් විසින් ඇමතිවරයාට කළ දැනුම් දීම මත පිළිගත හැකි හා නොහැකි යෝජනා සම්බන්ධව සිවිල් සංවිධාන නියෝජිතයින්ගේ සංශෝධන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

ඒ අනුව අමාත්‍යවරයා සමග පැවති තෙවන සාකච්ඡාවේදී ඉදිරිපත් කර ඇති සංශෝධනයන් මගින් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් හා අනෙකුත් මූලික නීතින්ට පටහැනිව මෙම සංශෝධන සිදු වී ඇති බවට සිවිල් සමාජ නියෝජිතයින් විසින් තව දුරටත් කරුණු ඉදිරිපත් කිරීම මත අමාත්‍යවරයා විසින් මේ සම්බන්ධව සිවිල් සමාජ යෝජනා මසක් තුළ ඉදිරිපත් කරන ලෙස යෝජනා කරනු ලැබුවාය.

# ප්‍රාදේශීය සංවිධාන සමග ඔවුන් මුහුණ දෙන ගැටලු, විසඳුම් යෝජනාවන් හා නව මර්ධනීය නීති පිළිබඳ පැවැති සාකච්ඡාවන්හි අදහස් හා පොදු එකඟතා

සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන ජාතික එකමුතුව විසින් 2021 සැප්. 16 සිට 2022 අගෝස්තු 27 දක්වා කාලය තුළ කොළඹ හා ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය නොවන සංවිධාන 677ක් සමග සිදු කළ සාකච්ඡා මාලාවක් පහත පරිදි පවත්වන ලදී.

**මේ වන විට පවත්වා ඇති ප්‍රාදේශීය රැස්වීම් පිළිබඳව විස්තර**

සූම් තාක්ෂණය ඔස්සේ සිදු කල රැස්වීම් - 7

| | පළාත/ දිස්ත්‍රික්කය | දිනය | සහභාගී වූ පිරිස් | සම්පත් දායකයින් |
|---|---|---|---|---|
| 01 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 2021.9.16 | 18 | රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක |
| 02 | සබරගමුව පළාත | 2021.09.18 | 40 | රුකී ප්‍රනාන්දු,නීතීඥ අර්මිසා ටීගල්, තිලක් කාරියවසම්, රෝහන හෙට්ටිආරච්චි, පිලිප් දිසානායක |
| 03 | ඌව පළාත | 2021.09.25 | 50 | රුකී ප්‍රනාන්දු,නීතීඥ අර්මිසා ටීගල්, රෝහන හෙට්ටිආරච්චි, පිලිප් දිසානායක |
| 04 | ගාල්ල දිස්ත්‍රික්කය | 2021.09.26 | 57 | රුකී ප්‍රනාන්දු, තිලක් කාරියවසම්, රෝහන හෙට්ටිආරච්චි, කුමුදුනී සැමුවෙල්, පිලිප් දිසානායක |
| 05 | මාතර දිස්ත්‍රික්කය<br><br>හම්බන්තොට දිස්ත්‍රික්කය | 2021.09.30 | 58 | නීතීඥ අර්මිසා ටීගල්, පිලිප් දිසානායක, නීතීඥ නදීශානි පෙරේරා |
| 06 | කුරුණෑගල දිස්ත්‍රික්කය | 2021.10.07 | 26 | ආචාර්ය ජෙහාන් පෙරේරා, රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක |
| 07 | පුත්තලම දිස්ත්‍රක්කය | 2021.10.18 | 33 | රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, නීතීඥ අර්මිසා ටීගල්,සමන් හමන්ගොඩ |
| | එකතුව | | 282 | |

භෞතිකව පැවැත් වූ රැස්වීම් - 13

| | පළාත/ දිස්ත්‍රික්කය | දිනය | සහභාගී වූ පිරිස් | සම්පත් දායකයින් |
|---|---|---|---|---|
| 01 | ගම්පහ | 2021.10.25 | 34 | තිලක් කාරියවසම්, රෝහණ හෙට්ටිආරච්චි, සමන් හමන්ගොඩ, රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, චමින්ද රාජකරුණා |
| 02 | කළුතර | 2021.11.09 | 35 | තිලක් කාරියවසම්, පිලිප් දිසානායක, අර්මිසා ටීගල්, චමින්ද රාජකරුණා |
| 03 | උතුරු මැද පළාත (හඹරන) | 2022.02.27 | 15 | රුකී ප්‍රනාන්දු, තිලක් කාරියවසම්, ජෙහාන් පෙරේරා, පිලිප් දිසානායක |
| 04 | මධ්‍යම පළාත (නුවර) | 2022.02.28 | 20 | රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, තිලක් කාරියවසම්, |
| 05 | ගාල්ල | 2022.03.22 | 45 | රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, ආචාර්ය ජෙහාන් පෙරේරා, නීතීඥ නදීෂානි පෙරේරා |
| 06 | මාතර | 2022.03.22 | 42 | රුකී ප්‍රනාන්දු, පිලිප් දිසානායක, ආචාර්ය ජෙහාන් පෙරේරා, නීතීඥ නදීෂානි පෙරේරා |
| 07 | කුරුණෑගල | 2022.03.29 | 30 | තිලක් කාරියවසම් |
| 08 | කෑගල්ල | 2022.04.02 | | තිලක් කාරියවසම් |
| 09 | බදුල්ල | 2022.04.02 | 60 | ගෞතමන් බාලචන්ද්‍රන්, පිලිප් දිසානායක, සුරේෂ් නඩේසන් |
| 10 | හම්බන්තොට | 2022.08.20 | 29 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,තිලක් කාරියවසම් |
| 11 | මොණරාගල | 2022.08.21 | 41 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,තිලක් කාරියවසම් |
| 12 | කළුතර | 2022.08.24 | 26 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,තිලක් කාරියවසම් |
| 13 | හැටන් | 2022.08.27 | 18 | පිලිප් දිසානායක, නීතිඥ දුලාන් දසනායක,තිලක් කාරියවසම් |
| | එකතුව | | 395 | |

මෙම සාකච්ඡාවන්වලදී වැදගත් කරුණු රාශියක් සාකච්ඡාවට ලක්වූ අතර එහිදී ඔවුන්ට රාජ්‍ය යාන්ත්‍රණය තුළින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින්, අනෙකුත් රජයේ ආයතනවලින් හා ආරක්ෂක අංශවලින් එල්ල වන ලද ගැටලු ප්‍රශ්න මූලික වශයෙන් සාකච්ඡාවට බඳුන් විය. එසේම ඔවුන්ගේ ලියාපදිංචියේ දී ඇතිවන ගැටලු, වැඩසටහන් සංවිධානය කිරීමේදී ඇතිවන ගැටලු ප්‍රශ්න ආදිය ද මෙහි දී සාකච්ඡාවට බඳුන් විය.

මෙම වැඩසටහන්වල දී මූලික අදහස් ඉදිරිපත් කළ සිවිල් සංවිධාන නායකයින් කිහිප දෙනෙකු පහත පරිදි අදහස් දක්වන ලදී.

**පිලිප් දිසානයක මහතා අනුරාධපුර දිස්ත්‍රික් සාකච්ජාවේ දී ඉදිරිපත් කළ අදහස් කිහිපයක්..**

''සිවිල් සංවිධාන ක්‍රියාකාරිත්වය අඩපණ කිරීම හෝ මෙල්ල කිරීම ක්‍රියාවලිය අද ඊයෙක ආරම්භ කළ එකක් නෙමෙයි. 2005 ආණ්ඩුව කාලේ නන්දන ගුණතිලක සහ විජිත හේරත් කියන මන්ත්‍රීවරුන් ඇතුළු විසි දෙනකුගෙන් යුතු කණ්ඩායමක් විසින් විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ඉදිරිපත් කළා. සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වය සම්බන්ධය විමර්ශනය කරන්න. එහි පළවෙනි නිර්දේශය තමයි මේ 1980 අංක 31 දරණ මේ වී එස් එස් ඕ පනත සිවිල් සංවිධාන අධීක්ෂන පනත සංශෝධනයට ලක්විය යුතුයි කියලා. ඊට අමතරව වාර්තාවෙන් ඉදිරිපත් උන යෝජනා අපේ නිදහසට බලපෑම් කරන යෝජනා. නමුත් සිවිල් සංවිධාන එයට විරුද්ධ වෙලා විශාල ව්‍යාපාරයක්

ගෙන ගියා. එහිදී මේ පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබුණා. එහිදී දිවයින පුරා විසිරී සිටින සිවිල් සංවිධාන දැනුවත් කරගෙන මේ පිළිබඳව අදහස් අරගෙන ඒ පනත ඉදිරිපත් වෙලා තිබුණු පනත් කෙටුම්පතට අපගේ සංශෝධනය ඉදිරිපත් කළා. මේකට හේතු විදිහට ඉදිරිපත් කරන එකක් තමයි ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් කියලා අපේ ක්‍රියාකාරීත්වය. ඒ එක්කම මුදල් විශුද්ධිකරණය, විශාල වශයෙන් නීත්‍යානුකූල නොවන මුදල් එහෙට මෙහෙට විසිරෙනවා ක්‍රියාත්මක වෙනවා කියන එක එක කාරණාවක්. අනෙක් පැත්තෙන් ස්වෛරීත්වයට භෞමික අඛණ්ඩත්වයට සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය බාධාවක් කියන ලේබල් එක යටතේ තමයි මේ කටයුතු සිද්ධ කරන්න උත්සාහ කරන්නේ.

සිවිල් සංවිධානය ක්‍රියාකාරීත්වය හරහා විශාල වැඩ කොටසක් සිද්ධ වෙනවා. ඒ වැඩ කොටස සම්බන්ධව අපිට වත් නිවැරදි තක්සේරුවක් නැහැ. අපි ඒ සම්බන්ධ හරියට තොරතුරු එකතු කරල ඒ සම්බන්ධව යම්කිසි ඉදිරිපත් කිරීමක් සාධාරණව කෙරිලා නෑ. අපි ඉදිරියේදී මේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව වාර්තාවක් කරන්න බලාපොරොත්තු වෙනවා. සහ මෙම සිවිල් සංවිධාන වලට විරුද්ධව තියෙන මතවාදවලට පෙරළා ප්‍රති උත්තර දෙන්න, මේ තියෙන ප්‍රචාරයට විරුද්ධව අපි කවුන්ටර් ඇටෑක් එකක් එහෙමත් නැතිනම් අපි හරියාකාර ඉදිරිපත් කිරීමක් කරන්න අවශ්‍යයි. ඒක කරන්න නම් මෙවැනි සංවාදයක් අපි අතර තියෙන්න ඕනි. අපි මොනවද කියන කරන්නේ කියන දේ අනිත් අය දැන ගන්න ඕනේ. ඒක හරහා අපිට අපේ ශක්තිය ගොඩනගාගෙන තමයි අපිට ඒකට ප්‍රති ප්‍රතිප්‍රහාරයක් එල්ල කරන්න වෙන්නේ. පසුගිය කාලේ වත්මන් රජය සමහර ආයතන වලට ඇවිත් නීතියට පිටින් අපේ කටයුතු පාලනය කිරීමට විවිධ පියවර ගත්තා. අපි අනාගතයේදී අපේ ශක්තිය හදාගෙන එවැනි නීතියට පිටින් කරන ක්‍රියාකාරීත්වයන් අඩපණ කිරීමට කටයුතු කිරීම අවශ්‍යයි. ඒ එක්කම අපේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ විශාල විවේචන තියෙනවා. රජයේ මාධ්‍ය විතරක් නෙමෙයි පෞද්ගලික මාධ්‍ය පාවිච්චි කරමින් සැලකිය යුතු විවේචන ඉදිරිපත් කරනවා. මෙවැනි තත්ත්වයක් මත අපේ ශක්තිය මත ඉදිරියේදී මෙයට මුහුණ දීමට සිදු වෙනවා.''

**රුකී ප්‍රනාන්දු මහතා අනුරාධපුර දිස්ත්‍රික් සාකච්ඡාවේ දී ඉදිරිපත් කළ අදහස් කිහිපයක්..**

''මෑත ඉතිහාසයේ වැදගත් දෙයක් 2018 සිද්ධ වුණා. වී එස් එස් ඕ පනතට ගේන්න හදපු වෙනස්කම් අගමැතිවරයා සහ එහි විෂය භාර අමාත්‍යවරයාගේ කැමැත්තෙන් කැබිනට් අනුමැතිය ලබාදී තිබියදී එය ඉල්ලා අස්කර ගත්තා. ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් තිබ්බා. ඒ සාකච්ඡාව තුළ දීම එය ඉල්ලා අස්කරගන්නවා කිව්වා. එහිදී සිවිල් සංවිධාන වලට එකතු වී මෙම නීති විය යුත්තේ කුමක්ද කියන ඇතුළත් යෝජනාවලියක් ලබා දෙන ලෙසට ඔවුන් ප්‍රකාශ කළා. මේ නියාමනය සිදු විය යුත්තේ කෙසේද යන්න අපටම යෝජනා කරන ලෙස පැවරුවා. අපි විවිධ පුද්ගල කණ්ඩායම් එකතු වී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා මාලාවක් ගෙන ගියා. මෙයට ලංකාවේ පළාත් නවයේම සංවිධාන 233 පුද්ගලයෝ 348 සහභාගීවී තිබුණා. එහිදී ප්‍රතිපත්ති මූලධර්ම මාලාවක් නිශ්චිත වශයෙන් මේ පනත වෙනස් විය යුත්තේ කෙසේද කියන යෝජනාවලියක් සාදා ගැනීමට අපට පුළුවන් වුණා. මෙහිදී මගේ නිරීක්ෂණය අනුව මත දෙකක් දැක්කා. විවිධාකාරයේ කණ්ඩායම්වල තිබුණු එක් මතයක් තමයි අපි නීතිමය වශයෙන් ලියාපදිංචි වීම අනිවාර්යය නැත කියන එක. ලංකාවේ ව්‍යවස්ථාවේ 14 වන වගන්තිය පළවෙනි කොටසේ ඈ වගන්තියේ සමාගමේ නිදහස බොහොම පැහැදිලිව තියනවා. ඉතා වැදගත් නිදහස් තුනක් තියෙනවා. මෙම ව්‍යවස්ථාවෙන් නීත්‍යානුකූලභාවය ලැබෙන නිසා ලියාපදිංචිවීම අත්‍යවශ්‍ය නෑ කියන එක සමහරුන්ගේ මතයයි. ව්‍යවස්ථාවෙන් ඔබ්බට ගියාම ජාත්‍යන්තර වශයෙන් තිබෙන සිවිල් හා දේශපාලන ප්‍රඥප්තියෙන් මේ දේම තිබෙනවා. ඒත් සමහර ප්‍රායෝගික හේතූන් මත ව්‍යවස්ථාවෙන් ලැබෙන නීත්‍යානුකූලභාවය ට අමතරව රාජ්‍ය කියන ආයතනයක ලියාපදිංචිවීම සිදු කරනවා. සමහර ආයතන මේ වී එස් එස් ඕ පනත මත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාර්යාලයේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙලා තියෙනවා. තවත් සමහරක් අය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තියෙනවා. මේ දෙක අප වෙන් වෙන් වශයෙන් හඳුනා ගත යුතුයි පලවෙනි කරුණ ව්‍යවස්ථාවෙන් ලැබෙන නීත්‍යානුකූලභාවය වැනි කරුණ අපගේ ප්‍රායෝගික අවශ්‍යතා මත ස්වෙච්ඡාවෙන් වෙන රාජ්‍ය ආයතනයක ලියාපදිංචිවීම. මෙය එම සාකච්ඡා මාලාවේ මතු වූ මතයයි. යම් යම් අවස්ථාවල වෙනස් මත තිබුණත් පොදුවේ ගත් කල රාජ්‍ය නිලධාරීන් සමග හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම වැදගත් යන්න දෙවැනි මතයයි.

අපගේ යෝජනාවලියේ මතු වූ වැදගත්ම කාරණා හයක් තියෙනවා. අපට සංවිධානය වීමේ නිදහස තිබෙනවා යන්න පලවෙනි මූලධර්මයයි. දෙවැනි කරුණ රාජ්‍ය නොවන සංවිධාන වලට සමාන ලෙස සැලකීම හෝ වෙනස් කොට නොසැලකීම. තුන්වැනි කරුණ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස. හතරවෙනි එක ස්වාධීනත්වය. මෙතනදි වැදගත් වෙන දෙයක් තමයි ස්වයං පාලනය. අපගේ වටිනාකම්, සැලසුම්, වැඩකිරීම නිර්ණය කිරීම කිරීමට හා තීරණය කිරීමට අපිට නිදහස තිබිය යුතුයි. මෙය ආණ්ඩුව විසින් අභියෝග කිරීමට උත්සහ කරනවා. අපගේ සැලසුම්වලට අභියෝග කිරීමට එයාලට හැකියාවක් තියෙනවා, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට ගරු කළ යුතුයි කියන දෙය අපට දැනුම් දීමට උත්සාහ කරනවා. මේක වැදගත් මූලධර්මයක් විදිහට අපි අඳුනගෙන තියෙනවා. සන්නිවේදනය කිරීම හා සහයෝගයෙන් වැඩ කිරීමට ඇති අයිතිය ඊළඟ මූලධර්මයයි. සිවිල් සංවිධාන ආරක්ෂා කිරීමට සහ මෙයට අදාල පරිසරය සැකසීමට රාජ්‍යයට යුතුකමක් තිබෙනවා යන්න හයවෙනි කරුණයි.

සිවිල් සංවිධාන, සිවිල් ව්‍යාපාර අතර තිබූ මේ ක්‍රියාවලිය 2018න් පසු ඉවර වුණා. ඉන්පසු 2019 අගෝස්තු මාසේ එවකට හිටපු විෂයභාර මනෝ ගනේෂන් ඇමති වරයාට බාර දුන්නා. ඉන්පසු ආණ්ඩුව වෙනස් වුණා. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ව තිබෙන කාර්යාලයට අලුතින් පත් වුණ ඩිරෙක්ටර් ජෙනරල් රාජා ගුණරත්නට 2020 අගෝස්තු මාසේ එම ලියවිල්ල ම බාර දුන්නා. 2021 අගෝස්තු මාසය වන විට කැබිනට් තීරණය ආවා. අලුත් නීතියක් සෑදීමට යෝජනාවක් සම්මත කරගෙන තියෙනවා. ඒ වෙනස්කම් සහ අඳුනාගත් මූලධර්ම 6 අපි එවකට හිටපු ආණ්ඩුවටත් දැන් ඉන්න ආණ්ඩුවටත් ලබා දීලා තියෙනවා. දැනට කතා කළේ මෙහි නීතිමය තත්ත්වය ගැන පමණයි. ආරක්ෂාව කියන්න නීතිමය පැත්ත පමණක් නෙවෙයි. එදිනෙදා ජීවිතයේදී අපේ ශාරීරික ආරක්ෂාව අත්අඩංගුවට ගැනීම් වගේ දේවල් වලින් ආරක්ෂාව වගේම තොරතුරු සන්නිවේදනය කිරීම ආරක්ෂාකාරීව කරන්නේ කොහොමද කියන දේ ගැන අවධානය යොමු කළ යුතුයි.''

**නීතීඥ අර්මිසා ටීගල් මෙනවිය පුත්තලම් දිස්ත්‍රික් සාකච්ජාවේ දී ඉදිරිපත් කළ අදහස් කිහිපයක්..**

''1980 ආපු පනත ගැන කතා කිරීමේ දී එම පනතේ තිබුණේ ස්වෙච්ඡා සංවිධාන හැටියට හඳුනා ගත් සංවිධාන ලියාපදිංචි කීරීමේ ක්‍රමයක්. ඒ පනතේ තිබුණේ නැහැ සංවිධාන පාලනය කිරීම හා දත්ත ලබා ලබා ගැනීම කියන දේ. නමුත් මේ කාලයේ වන විට ඒ පනත තුල නොතිබුණු බලයක් රජය සතු කර ගැනීමටහ් බලාපොරොත්තු වෙනවා. මොවුන් මේ පනත සංශෝධනය කරන්න හදන්නේ මෙම සංවිධාන වලට ලැබෙන මුදල් අවභාවිතා කරනවා කියන නමින්. ඒ වගේ ම සිවිල් සංවිධානවල ලියාපදිංචිවීම අනිවාර්ය දෙයක් නෙවෙයි. නමුත් සමහර ඒකාබද්ධ වැඩ කටයුතු වල දී ඒ ඒ සංවිධාන වල පිළි ගැනීම අත්‍යවශ්‍ය වෙනවා. නමුත් යම්කිසි යම්කිසි අපරාධයක් වූ විට ලියා පදිංචි වූ ආයතන වලටත් නො වූ ආයතන වලටත් එක සමාන ලෙස අධීක්ෂණ කටයුතු කර ගෙන යනවා. එසේ වුවත් සමහර සුබ දායක කටයුතු වල දී එසේ කරන්නේ නැහැ. ඔවුන්ට පක්ෂපාතී සංවිධාන වලට එක් කාරයටත් අනෙක් සංවිධාන වලට තවත් ආකාරයටත් තමයි ඔවුන් සලකන්නේ. ඒ සංවිධානය පිළිබඳව නීතිය වෙනස් වෙනවා නම් ඒ නීතිය වෙනස් වෙන්න ඕනේ යහපතක් වෙන විදිහට. නමුත් මෙසේ සංවිධාන තමන්ගෙ යටතට ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම කිසිසේත් ම හොඳ දෙයක් නෙවෙයි . කාරණය තමයි අභියෝග අභියෝග ගැන කතා කිරීමේදී ලියා පදිංචි වීමේ සිට සංවිධාන වලට විශාල අභියෝග වලට මුහුණ දෙන්න සිදු වෙනවා ඒ වගේම වාර්තා ලිවීම එනම් සමහර සංවිධානවලට හදිසිය යම් දෙයක් ක්‍රියාත්මක කරන්න සිදු වුණත් ඒ සඳහා ද වාර්තා ලිය ලිය සිටීමට සිදුවෙනවා. එමෙන්ම එම සංවිධාන වල සිටින සමාජිකයන් ගේ සියලූ විස්තර ඉල්ලා සිටීමේදී බොහෝ විට සංවිධාන අනාරක්ෂිත භාවයට පත් වෙනවා.''

**රෝහණ හෙට්ටිආරච්චි මහතා ගාල්ල දිස්ත්‍රික් සාකච්ජාවේ දී ඉදිරිපත් කළ අදහස් කිහිපයක්..**

''ගිය ආණ්ඩුවෙන් මෙම පනත සංශෝධනය කිරීමේ දී අපගේ විකල්ප යෝජනා ගැන අහස් විමසුවා. ඒ අනුව අපි යෝජනාවලියක් සකසා ගත්තා. 2019 අගෝස්තු මාසයේ තමයි අපි ඒ යෝජනාවලිය එවකට හිටපු ආණ්ඩුවට බාර දුන්නේ. ඒ අනුව 2020 වෙද්දි වෙනත් ආණ්ඩුවක් මාරු වුණා. ඒ ආණ්ඩුවටත් අපි මෙම ලියවිල්ල ලබාදීලා තිබෙනවා. නමුත් මේ වෙද්දි මේ පනත අහෝසි කර නව පනතක් ගෙන එන්න මේ රජය සූදානම් වෙනවා. මේ පිළිබඳව අපේ සමහර සහෝදර සහෝදරියන්ට හැකිවෙලා තියෙනවා රජයේ පාර්ශව සමඟ සමග සාකච්ඡාවලට යන්න. එම නිසා අපේ යෝජනා කිහිපයක් රජයේ හමුවට ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.''

**තිලක් කාරියවසම් මහතා ගම්පහ දිස්ත්‍රික් සාකච්ජාවේ දී ඉදිරිපත් කළ අදහස් කිහිපයක්..**

''අපි සිවිල් සංවිධාන විදිහට රජයේ නොයෙකුත් ක්‍රියාකාරකම්වලට මුහුණ දීමට සිදුවෙනවා. වරෙක පනත් සංශෝධනය කරනවා, පනත් අත්හිටුවනවා. ඒ වගේම නැවත අළුත් පනත් ගේනවා. ඉතින් මෙවැනි ක්‍රියා නිසා සිවිල් සමාජ වල ක්‍රියාකාරීත්වයට නොයෙකුත් බලපෑම් ඇති වෙනවා. එමෙන්ම අප සිදුකරන නොයෙකුත් සමාජ සේවා අගයන්නේ නැතුව අප බටහිරවාදීන් ලෙස විවේචනය කරන්න පෙළඹිලා ඉන්නවා. ඒ වගේම ඔවුන්ගේ යම් යම් ක්‍රියා ක්‍රියාකලාප නිසා සංවිධාන වල සිටින සාමාජිකයන්ගේ ආරක්ෂාවට ද තර්ජන එල්ල වෙලා තිබෙනවා. එක නුවර සංවිධානයක එම සංවිධානයේ නායකයන් ඇති විට එම සංවිධානයේ අනෙක් සාමාජිකයන් ගෙන් ප්‍රශ්න කරලා තිබ්බා. එමෙන්ම ඔවුන් ගේ ලියකියවිලි ඇදලා දාලා තිබුණා. එම පුද්ගලයා එහිදී එහි දී ඔහුව හඳුන්වා දී තිබුණේ මම ජනාධිපති නියෝජිතයෙක් කියලා. ඒ වගේම ඔහු පවසා සිටියා ජාතික ආරක්ෂාව වෙනුවෙන් තමයි ඒ දේවල් කරන්නේ කියලා. ඉතින් මෙවැනි ගැටලූ මගහරවා ගැනීමට අප සියලූ දෙනාම එකමුතු වී කටයුතු කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. අපේ සංවිධාන විවිධත්වයෙන් යුක්ත වුවත් අපි මේ වැඩ කරන්නේ පොදු අරමුණක් උදෙසා එම නිසා අප සියලූ දෙනාම දැක්මක් අනුව කටයුතු කිරීම කළ යුතු වෙනවා. ඉතින් එම නිසා අපි සියලූ දෙනාම එකට එකතු වී මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමු.''

ප්‍රාදේශීය සිවිල් සංවිධාන නියෝජිතයන් ද මෙහිදී සක්‍රීයව ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළ අතර ඔවුන්ගේ ගැටලු ලැයිස්තුගත කර ගැනීමට මෙන්ම ඒ සඳහා විසදුම් යෝජනා ද සකස් කර ගැනීමට හැකි විය. එකී ගැටලු හා ඒවා සඳහා ඉදිරිපත් කළ විසදුම් යෝජනා පහත පරිදිය.

| | ගැටලු | විසදුම් යෝජනා |
|---|---|---|
| 01 | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ කටයුතු කරනු ලබන සමහර නිලධාරීන්ගේ රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි ඇති වෛරී ආකල්පයන් වෙනස් කිරීම | රාජ්‍ය නොවන සංවිධාන විසින් කරනු ලබන සේවාවන් හා ක්‍රියාවන් සම්බන්ධව හා රටට ගෙන එනු ලබන විදේශ විනිමය සම්බන්ධව අධ්‍යයනයකින් පසුව ඔවුන් යම් කිසි ඇගයීමකට භාජනය කිරීම. රාජ්‍ය නොවන සංවිධාන සමග සුහදශීලීව කටයුතු කරන ක්‍රමයක් ස්ථාපිත කිරීම |
| 02 | සමහර රාජ්‍ය නොවන සංවිධාන වෙනස් කොට සැලකීම | සියළුම රාජ්‍ය නොවන සංවිධාන එක හා සමානව සැලකීම, වෙනස් කොට නොසලකන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දීම හා වෙනස්කොට සැලකීම් පිළිබඳව සොයා බැලීම සඳහා ඒකකයක් ස්ථාපිත කිරීම |
| 03 | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ අරමුණු හා වගකීම් පිළිබදවත් එහි සීමාවන් හා නෛතික රාමුව පිළිබඳව අවබෝධය ප්‍රමාණවත් නොවීම. | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් හා අවබෝධයෙන් කටයුතු කිරීම මූලික පරමාර්ථයක් කර ගැනීම. ලේකම් කාර්යාලයේ වගකීම් සීමාවන් හා නෛතික තත්ත්වයන් පිළිබදව රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීම සදහා විවිධ වැඩසටහන් ඒකාබද්ධව සූදානම් කිරීම. |
| 04 | මෙම ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂකවරයා (ලේඛකාධිකාරී) ඇතුළු සමහර නිළධාරීන්ගේ විවිධාකාර හැසිරීම්, බියගැන්වීම් හා තර්ජනයන් (මම පිස්සු බල්ලෙක් වගේ හපා කනවා) නැවත ඇති නොවන ආකාරයට ඒම තනතුරේ ගරුත්වය ආරක්ෂා කිරීම හා එහි වගකීම් නිශ්චිත කිරීම | අධ්‍යක්ෂකවරයාගේ (ලේඛකාධිකාරී) මෙම තනතුරේ වගකීම් හා නෛතික සීමාවන් පිළිබදව පැහැදිලිකර ගැනීම හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ කටයුතු හා රජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධය වෘත්තීය මට්ටමින් දියුණු කිරීමට කටයුතු කිරීම. |
| 05 | සමහර දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යල තුළ සිටින රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ නිලධාරීන් ගේ අත්තනෝමතික ක්‍රියා මාර්ග හා අධිපතිවාදී ස්වරූපය. | තම නෛතික සීමාවන් තුළ ඉතා සුහදශීලීව හා සහයෝගයෙන් කටයුතු කිරීම සදහා අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් වෙත ලබා දීම හා ඒසේ කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීම. දෙපාර්ශවයේ ගැටළු සාකච්ඡා කිරීම සදහා අවස්ථාවන් සැලසීම |
| 06 | ප්‍රාදේශීය ලේකම්/ග්‍රාම නිලධාරී ඇතුළු නිලධාරීන්ගෙන් ව්‍යාපෘති ක්‍රියාකාරම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ඇති දුෂ්කරතා හා විටින් විට විවිධාකාරයේ වාර්තා ඉල්ලා සිටීම, එම වාර්තා අධිකාරීන් කිහිපයක් වෙත යොමු කිරීමට සිදු වීම | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සදහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රමය පිළිබදව නැවත සලකා බැලීම. අනුමැතියක් අවශ්‍ය වන්නේ නම් සරල ක්‍රමයක් ස්ථාපිත කිරීම, වාර්තාකරණය සම්බන්ධව සරල ව්‍යුහයක් සැකසීම හා දෙපාර්ශවය එකගවන එක් අධිකාරියකට ඒම වාර්තා යොමු කිරීම. |
| 07 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් (පලාත්පාලන ආයතන) හරහා සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සදහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ඇති ගැටළු | සියළු ව්‍යාපෘති ක්‍රියාකාරම් සදහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබදව නැවත සලකා බැලීම හා අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාකාරකම් වෙනුවෙන් පමණක් අනුමැතිය ලබා ගැනීමට යොමු කිරීම |

| | | |
|---|---|---|
| 08 | යුධ, ගුවන්, නාවික, පොලිස් හා රාජ්‍ය බුද්ධි අංශ විටින් විට විවිධ සංවිධාන වෙත පැමිණීමත්, ඔවුන් විසින් විවිධ වාර්තා හෝ තොරතුරු ඉල්ලා සිටීම. | ඒසේ තොරතුරු අවශ්‍ය නම්, සිවිල් අධිකාරීන් හරහා එම තොරතුරු ලබා ගැනීමට ක්‍රමයක් සැකසීම. ආරක්ෂක අංශ විසින් සිදු කරනු ලබන බලපෑම්, තර්ජන හෝ බියගැන්වීම් ඇති වන ආකාරයේ ක්‍රියාවන් වැලැක්වීමට කටයුතු කිරීම. යම් සංවිධානයකට එරෙහිව විශේෂ පැමිණිල්ලක් හෝ පරීක්ෂණයක් නොමැති අවස්ථාවක දී ආරක්ෂක අංශ විසින් සිදු කරනු ලබන මැදිහත්වීම් නතර කිරීමට කටයුතු කිරීම |
| 09 | ආරක්ෂක අංශ සමහර සංවිධාන ක්‍රියාධරයන්ගේ පුද්ගලික නිවෙස් වෙත පැමිීම හා තොරතුරු ඉල්ලා සිටීම. (ක්‍රියාධරයන් නිවසේ නොමැති අවස්ථාවල මෙම ආරක්ෂක අංශ පැමිණ ඇති බව වාර්තා වේ) ඒ හේතුවෙන් පවුලේ සාමාජිකයින් බියට පත්වීම. | තොරතුරු ලබා ගැනීමේ මුවාවෙන් සංවිධාන ක්‍රියාධරයන් බිය ගැන්වීම වැලැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. යම් සංවිධානයක තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් නිත්‍යානුකූළ ක්‍රමවේදයක් හරහා කාර්යාල වෙත පමණක් පැමිණ එම තොරතුරු ලබා ගැනීම. |
| 10 | වෙනත් දිස්ත්‍රික්කයක් තුළ වැඩ කිරීමේ දී ඇතිවෙන දුෂ්කරතා. | අරමුදල් හා හැකියාව ඇති සංවිධාන වෙත ඒසේ කටයුතු කිරීමට ඇති දුෂ්කරතා ඉවත් කිරීම |
| 11 | රජයේ සංවර්ධන වැඩසටහන් සමග කටයුතු කරණු ලබන සංවිධාන වෙත ලබා දෙන සහයෝගය අනෙකුත් වැඩසටහන් කරණු ලබන සංවිධාන සඳහා ලේකම් කාර්යාල විසින් එතරම් ඉඩ ලබා නොදීම | සංවර්ධනය මෙන්ම, සාමය, පරිසර, මානව අයිතීන් වෙනුවෙන් කටයුතු කරන සංවිධාන සඳහා ද සමානව සැලකීම |
| 12 | නව සංවිධාන ලියාපදිංචි කිරීමට යාමේ දී මතුව ඇති දුෂ්කරතා. | නව සංවිධාන ලියාපදිංචිය සඳහා ඇති නීති හා ක්‍රමවේදයන් ලිහිල් කර සංවිධාන ලියාපදිංචියට අවස්ථාව විවර කිරීම. |
| 13 | රජය හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීත්වය අතර අනෙන්‍යාන්‍ය සහයෝගීතාව පළුදුවී තිබීම | සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය මුහුණ දෙන ගැටළු නිරාකරණය සඳහා අමාත්‍යංශය, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කර්යාලය අතර සන්නිවේදනය ක්‍රමයක් ස්ථාපිත කිරීම. |

ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයන් වෙත රාජ්‍ය ආරක්ෂක අංශය වෙතින් පැමිණි බලපෑම් පිළිබඳවද මෙහිදී සාකච්ඡා වුනු අතර ප්‍රාදේශීය සිවිල් සංවිධාන එකී තර්ජනයන් පිළිබඳව හෙළි කරන ලද්දේ ඔවුන්ගේ අනන්‍යතාවයද හෙළිදරව් නොකරන ලෙස ඉල්ලීම් කරමින් බවද මෙහිදී සිහිපත් කල යුතුය. එකී තර්ජනයන් කාර්යාලයට පැමිණ හේතු දක්වා හෝ නොදක්වා ලේඛන පරීක්ෂා කිරීම්, ගිණුම් පොත් පරීක්ෂා කිරීම්, ආයතනයේ සේවකයන්ගේ නිවෙස් වලට ගොස් ප්‍රශ්න කිරීම් හි සිට ත්‍රස්ත විමර්ශන ඒකකයට කැදවීම් දක්වා පරාසයක විහිදෙයි. ප්‍රාදේශීය සංවිධාන නියෝජිතයන්ගේ පොදු අදහසක් වුනේ මොනයම් හෝ පනතක ලියාපදිංචි වුවද නොවුනද ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මත ආරක්ෂක අංශයන්ගෙන් එල්ල වන බලපෑම් විවිධ පරිමාණයන්ගෙන් ඉදිරියේදීත් එල්ල විය හැකි බවයි. මෙම තර්ජනයන් පිළිබඳ කාන්තා සංවිධානයන්ද, වතුකරය ආශ්‍රිතව කටයුතු කරන සංවිධානයන්ද ඇතුළු විවිධ ආන්තික කොටස් නියෝජනය කරන සංවිධාන අදහස් දක්වන ලදී.

මෙම සියළු සාකච්ඡා අවසානයේ ඒවා සමාලෝචනය කරමින් සිවිල් සංවිධාන ලෙස මෙම රාජ්‍යයේ අනීතික මර්ධනයන්ට හා මර්ධනය නීතිගත කිරීමේ උත්සහයන්ට එරෙහිව කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ එකගතාවයන් සකස් කර ගන්නා ලදී.

එකී එකගතාවයන් පහත පරිදිය.

## එකඟතා

1. රජය සමඟ කටයුතු කළ හැකි හෝ නොකළ හැකි සිවිල් සංවිධාන හෝ රාජ්‍ය නොවන සංවිධාන ස්වාධීන හා මධ්‍යස්ථ විය යුතු අතර නිවැරදි අරමුණකින් ක්‍රියා කළ යුතුය.
2. රජය හෝ සියලුම දේශපාලන පක්ෂ සමඟ විනිවිදභාවයෙන් කිරීමට උත්සාහ දැරිය යුතුය.
3. සිවිල් සංවිධාන හෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් සිදුකරන වැඩසටහන් පිළිබඳව රජය දැනුවත් කළ යුතුය. ඒ හරහා රාජ්‍ය මර්දනය අවම කිරීමට හැකියාව පවතී.
4. සිවිල් සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක්, ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු අතර රාජ්‍යය වෙනස් වුවද එය ස්ථාවර ලෙස ක්‍රියාත්මක කළ යුතුය.
5. සිවිල් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ සමාජයේ මතය වෙනස් කිරීමට උත්සාහ කළ යුතුය. ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයි.
6. සිවිල් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන කිසිවිටකත් අන්තවාදීන්ගේ ක්‍රියාවලට අනුබල දීම හෝ දිරිගැන්වීම නොකළ යුතු අතර එය පාලනය කිරීමට යෝජනා ගෙන ආ යුතුය.
7. රටේ සිවිල් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් සකස් කර එම සංවිධාන සම්බන්ධ කර ගනිමින් ජාලය ස්ථාපිත කළ යුතුය. සියලුම සංවිධාන තම සහෝදර සංවිධාන ගැන අවබෝධයක් තිබිය යුතුය.
8. සංවිධාන තමන්ගේ වාසිය තකා කටයුතු නොකළ යුතු අතර අන් අයගේ සුබසාධනය සඳහා කටයුතු කළ යුතුය. ඒ සඳහා සෑම ආයතනයක්ම අවබෝධයෙන් කටයුතු කළ යුතුයි.
9. සමහර සිවිල් සමාජ නායකයන් දේශපාලනය කරන අවස්ථා තිබෙනවා. ඒ ගැන පුළුල් සංවාදයක් ඇති විය යුතුයි.
10. සියලූම සිවිල් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන එක හා සමානව සැලකිය යුතු අතර කිසිදු සංවිධානයකට වෙනස්කම් නොකළ යුතුය. ඒ වගේම ආන්තික සංවිධාන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුයි.
11. සෑම අවස්ථාවකදීම සිවිල් සංවිධාන එක්ව කටයුතු කළ යුතු අතර කිසියම් සංවිධානයකට ගැටලුවකට මුහුණ දීමට සිදුවුවහොත් එම සංවිධානයට අවශ්‍ය දැනුම, ශක්තිය සහ අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුය.
12. රාජ්‍යය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ශක්තිය සෑම විටම ලබාදිය යුතු අතර, යම් වංචාවක් දූෂණයක් සිදුවේ නම් ඊට එරෙහිවීමට සහ ඊට එරෙහිව අවශ්‍ය පියවර ගැනීමට ද කටයුතු කළ යුතුය.
13. රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන පාලනය සහ මර්දනය ගෙන එන ඕනෑම ආඥාපනත හෝ සංශෝධනයකට ප්‍රතිවිරෝධය දැක්විය යුතුය. එහිදී හොඳ අවබෝධයක් ලබාගෙන අවශ්‍ය පියවර ගත යුතුයි. එහිදී සියලුම සිවිල් සංවිධාන එක්ව කටයුතු කළ යුතු අතර අවශ්‍ය නම් නීතියේ පිහිට ද ලබාගත යුතුයි.